# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.08.10 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 13-2017**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>අක්‍රීය කරන ලද වැට් ලියාපදිංචි තැනැත්තන් සහ තාවකාලික ලියාපදිංචි තැනැත්තන් විසින් අය කරනු ලබන වැට් බදු සම්බන්ධව දැනුවත් කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් 2015.06.26 දින නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) -05/2015 කෙරෙහි ඔබගේ අවධානයට යොමු කරවමි.

02. රජයේ ආයතන වෙත භාණ්ඩ හා සේවා සැපයීමේදී සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් විසින් අක්‍රීය කර ඇති වැට් ලියාපදිංචි අංකයන්ට හා ආනයන හා අපනයන කටයුතු සඳහා ලබාදෙන ලද තාවකාලික ලියාපදිංචි අංක යටතේ වැට් බදු අයකර දේශීය ආදයම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකරන බව හෙළිදරව් වී ඇති බව දැනුම් දී ඇති බැවින්, ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව /ආයතනය යටතේ පවතින සියළු ආයතනවලට භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ විස්තර දේශීය ආදයම් දෙපාර්තමේන්තුවට යොමු කර සක්‍රීය ස්ථිර වැට් බදු ලියාපදිංචි තැනැත්තන් බවට තහවුරු කරගෙන පමණක් එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම් කරන ලෙස එම උපදෙස් ලිපිය මඟින් දැනුම් දෙන ලදි.

03. තවද 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364(3) අනුව ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට දන්වා යැවිය යුතු බවත් එහි සඳහන් කර ඇත.

04.එනමුත් පළාත් සභාවට අයත් සමහර අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා ආයතන 2016 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචිය අවලංගු වී ඇති (සක්‍රීය නොවූ) සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඇති අවස්ථා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන විමසුම් මගින් අනාවරණය කර ඇත.


| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 2234052<br>091 2226118 | |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | |
| වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk | | | |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

05. එබැවින් ඔබ අමාත්‍යාංශය ,දෙපාර්තමේන්තුව හා ආයතනය යටතේ පවතින සියළු ආයතනවල පසුගිය කාල සීමාව තුල වැට් බදු ගෙවීම්වල නිත්‍යානුකූලභාවය හා නිවැරැදිභාවය පිළිබඳව කඩිනමින් නැවත පරීක්ෂා කර වැට් බදු වශයෙන් වැඩිපුර ගෙවා ඇති වටිනාකම ( විගණකාධිපති දෙපාර්තමේන්තුව විගණන විමසුම් මඟින් අනාවරණය කර ඇති වැට් බදු වශයෙන් වැඩිපුර ගෙවීම්ද ඇතුලත්ව) නොපමාව අදාල සැපයුම්කරුවන්ගෙන්/කොන්ත්‍රාත්කරුවන්ගෙන් ආපසු අයකර ගැනිමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.එලෙස වැඩිපුර ගෙවීම් කර ඇති සැපයුම්කරුවන්ට/කොන්ත්‍රාත්කරුවන්ට ඉදිරි ගෙවීම් කිරිමට පෙරාතුව නියමිත අයකිරීම් කරන ලෙස ද වැඩිදුරටත් දැනුම් දෙමි.

06.එසේම ඔබ අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුවට අයත් ආයතන විසින් සක්‍රිය ලියාපදිංචිය රහිත සැපයුම්කරුවන්ට/කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු (VAT) වැඩිපුර ගෙවීම් පිළිබඳ විස්තර වාර්තාවක් 2017.08.24 දිනට ප්‍රථම මා වෙත දන්වා එවිමට කටයුතු කළ යුතුය.

07.සක්‍රිය ස්ථිර වැට් බදු ලියාපදිංචිය සහිත තැනැත්තන්ට පමණක් එකතු කළ අගය මත බදු ගෙවීමට කටයුතු කිරීම දකුණු පළාත් මුදල් රීති සංග්‍රහයේ මූල්‍ය රීති 85,86 හා 87 ප්‍රකාරව ගෙවීම් අනුමත කරන ,සහතික කරන හා ගෙවීම් කරන බලයලත් නිලධාරීන්ගේ වගකිම වන බවත් අවධාරණය කරමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : මේ පිළිබඳව පරීක්ෂා කර බැලිමට.





# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/1/1/1/2013 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015.06. 26 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල් ) 05 / 2015

දකුණු පළාත් සභාවේ,

ප්‍රධාන ගණන් දීමේ නිලධාරින් හා

ගණන් දීමේ නිලධාරින් වෙත.

**<u>අක්‍රිය කරන ලද වැට් ලියාපදිංචි තැනැත්තන් සහ තාවකාලික ලියාපදිංචි තැනැත්තන් විසින් අයකරනු ලබන වැට් බදු සම්බන්ධ දැනුවත් කිරිම.</u>**

උක්ත කරුණ සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ( එකතු කල අගය මත බදු) විසින් නිකුත් කර ඇති අංක CIR/VAT/2015/155 හා 2015.05.27 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම ලිපිය මඟින් දන්වා ඇති පරිදි, රජයේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සහ සංස්ථාපිත මණ්ඩල වෙත භාණ්ඩ හා සේවා සැපයීමේදී සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් විසින් අක්‍රිය කර ඇති වැට් ලියාපදිංචි අංකයන්ට හා ආනයන හා අපනයන කටයුතු සඳහා ලබා දෙන ලද තාවකාලික ලියාපදිංචි අංකයන් යටතේ වැට් බදු අයකරන නමුත්, එම වැට් බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකරන බව හෙළිදරව් වී ඇති බව දන්වා ඇත. එබැවින් ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අයත් ආයතනවලට භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ සක්‍රියතාවය පිළිබඳව විස්තර පහත සඳහන් ආකෘතියට අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැට් විගණන අංශය වෙත යොමු කිරීමෙන් තහවුරු කර ගෙන ,සක්‍රිය ස්ථිර වැට් බදු ලියාපදිංචි තැනැත්තන්ට පමණක් වැට් බදු ගෙවීම් කරන ලෙස කාරුණිකව දන්වමි.

| ලියාපදිංචි තැනැත්තාගේ නම | ලිපිනය | වැට් ලිපිගොනු අංකය |
|---|---|---|
| | | |

→ 02 පිටුව

...ලේකම් / ...ன செயலாளர் / ...f Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச் தஹநாயக மாவத்தை, காலி

03. එසේම 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) අනුව ටෙන්ඩර්කරුවකුට / සැපයුම්කරුවකුට එකතු කල අගය මත බද්ද ගෙවන විට, එසේ ගෙවන ලද බදු පිළිබඳ විස්තර පහත ආකෘතිය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට දන්වන ලෙසටත් , උක්ත ලිපියෙහි සඳහන් උපදෙස් අනුගමනය කිරීමට ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළු ආයතන දැනුවත් කරන ලෙසත් දැනුම් දෙමි.

| වැට් ලිපිගොනු අංකය | පුද්ගලයාගේ / ආයතනයේ නම | ගෙවීම් කල දිනය | ගෙවීම බැර කල කාලය | සැපයුම් වටිනාකම රු. | ගෙවූ වැට් බද්ද රු. | ගෙවූ මුළු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත් :

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස.

02. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - දැ.ගැ.ස.

03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,දකුණු පළාත - අභ්‍යන්තර විගණනයේදී පරීක්ෂා කිරීමට.